# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2290/22 – 2022 ජූලි 27 වැනි බදාදා – 2022.07.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/236.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එන්. ඒ. විජේසේකර මිය, අංක 26/B, ජයවීර මාවත, ඇතුල් කෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොළොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පර්ච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, කයිලාගොඩ, අංක 10ඒ, වීරවන්නි මුදියන්සේලාගේ ප්‍රියංකා සුභාෂිණී මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 29 වැනි දින,
කොළඹ දීය.

1A – G 37132 – 14 (2022/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2019/236.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එන්. ඒ. විජේසේකර මිය, අංක 26/B, ජයවීර මාවත, ඇතුල් කෝට්ටේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොළොන්නාව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

'' සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ A VII ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට තෝරා ගැනීම සඳහා 2018 ජූලි මස පැවති සම්මුඛ පරීක්ෂණයේ දී B 1 ශ්‍රේණියේ ගිණුම් ලිපිකාරිනියක ලෙස සේවය කරන එම්. එන්. ඒ. විජේසේකර මිය හට යම් අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න හා එසේ සිදු වී ඇත්නම් ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූනි මස 28 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07-0147

---

මගේ අංකය: IR/COM/02/2019/238.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.05.06 වැනි දින අංක 2226/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.04.22 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. තිස්ස යාපා මයා, අංක 292, ගැමුණු මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ.

අතර පවත්නා 2021.04.20 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව

වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජයසේකර මුදියන්සේලාගේ කපිල ජයසේකර මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ ජයසේකර මුදියන්සේලාගේ කපිල ජයසේකර මහතා ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින්, යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.04.22 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0148/1

---

මගේ අංකය: IR/COM/02/2019/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. තිස්ස යාපා මයා, අංක 292, ගැමුණු මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ. පෙ. 21, නාවල, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පර්ච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහරගම, නාවින්න, ශ්‍රී දේවානන්ද පාර, අංක 33, නීතීඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2019/238.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. තිස්ස යාපා මයා, අංක 292, ගැමුණු මාවත, කොටුවේගොඩ, රාජගිරිය.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

'' ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවය කරන ලද ඩී. තිස්ස යාපා මහතාගේ විනයානුකූල පරීක්ෂණයේ දී 2011.01.01, 2012.01.01, 2013.01.01 හා 2014.01.01 වර්ෂවල වැටුප් වර්ධක විලම්භනය කිරීමට ලබා දෙන ලද තීන්දුව මගින් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේ ද ? එසේ සිදු වී තිබේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූනි මස 21 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07-0148/2